ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>නාගපට්ටිනම් සහ කන්කසන්තුරය අතර මගී ප්‍රවාහන බෝට්ටු සේවාව නැවත ඇරඹේ</u>

ඉන්දීය නැව් සමාගම විසින් 2023 ඔක්තෝබර් මස ඉන්දියාවේ නාගපට්ටිනම් සහ ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ යාපනය ආසන්නයේ කන්කසන්තුරය අතර ආරම්භ කරන ලද මගී ප්‍රවාහන බෝට්ටු සේවා 2024 මැයි 13 වන දින යළි ආරම්භ කිරීමට නියමිතය. මෙම බෝට්ටු සේවාව ඉන්දීය නැව් සමාගම විසින් ශ්‍රී ලංකා රජයේ උපදෙස් පරිදි තෝරාගත් පෞද්ගලික සමාගමක් වන ඉන්ද්ශ්‍රී ෆෙරි සර්විසස් විසින් ක්‍රියාත්මත කරනු ඇත.

2. මෙම සේවාව මගීන් සඳහා දැරිය හැකි මුදලකට සහ ආකර්ෂණීය ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දීය රජය වසරක කාලයක් සඳහා අදාළ ඇතැම් ගාස්තු සහ නාගපට්ටිනම් වරායේ මෙහෙයුම් පිරිවැය මසකට ශ්‍රී ලංකා රුපියල් මිලියන 25කට වැඩි අගයක් දක්වා දරා ගැනීමට තීරණය කර ඇත. එසේම, මගී ප්‍රවාහන බෝට්ටු සහ නෞකා වලින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගීන්ගෙන් දැනට අය කරන විතැන්වීමේ බද්ද ද ශ්‍රී ලංකා රජය විසින් අඩු කර ඇත. මුලදී ණය පහසුකමක් යටතේ සිදු කිරීමට නියමිතව

තිබූ කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ද ඉන්දියාව ශ්‍රී ලංකා රජය වෙත ඇමරිකානු ඩොලර් මිලියන 63.65ක් ලබා දෙන ලදී. මෙම පියවර ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසාධනය සහ ප්‍රගතිය සහ සෞභාග්‍යය සඳහා ඉන්දියාවේ දැඩි කැපවීම පිළිඹිබු කරයි.

3. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සමුද්‍රීය සම්බන්ධකතාවය ශක්තිමත් කිරීම ශ්‍රී ලංකා ජනාධිපතිතුමා විසින් 2023 ජූලි මාසයේදී සිදු කරන ලද ඉන්දීය සංචාරය අතරතුරදී ඒකාබද්ධව ප්‍රකාශයට පත් කරන ලද ආර්ථික හවුල්කාරීත්වය සඳහා දැක්මෙහි ප්‍රධාන අංගයකි. මෙම මගී ප්‍රවාහන බෝට්ටු සේවාව නැවත ආරම්භ කිරීම ඉන්දීය රජයේ ජනතා කේන්ද්‍රීය ප්‍රතිපත්තීන් යළි තහවුරු කරයි. 2023 ඔක්තෝබර් මාසයේදී ප්‍රවාහන බෝට්ටු සේවාව සමාරම්භ කළ අවස්ථාව අමතමින් අග්‍රාමාත්‍ය ශ්‍රී න රේන්ද්‍ර මෝදි මහතා සඳහන් කළේ සම්බන්ධකතාවය යනු නගර දෙකක් සමීප කිරීම පමණක් නොව රටවල් දෙකක් හා එහි ජනතාව සමීප කිරීමක් ද වන බවයි. 2023 සැප්තැම්බර් මාසයේදී ඉන්දියාවේ පැවති G20 සමුළුවේ දී එළි දක්වන ලද ඉන්දියා - මැද පෙ රදිග - යුරෝපා ආර්ථික කොරිඩෝවෙන් අප දෙරට අතර බහුවිධ සම්බන්ධකතාවය සවිමත් කරන බැවින් ශ්‍රී ලංකා ජනතාවට සෙත සැලසෙන බව එතුමා ප්‍රකාශ කළේය.

4. අනාගතයේදී විදුලිබල ජාල අන්තර්සම්බන්ධතාවය, ද්වි දිශානතික තෙල් නලය සහ භූමි සම්බන්ධකතා ආර්ථික කොරිඩොව මගින් ශ්‍රී ලංකාව සමඟ සම්බන්ධකතාවය තවදුරටත් ඉහළ නැංවෙනු ඇත.

***

**කොළඹ**

2024 මැයි 05